# SUGGESTED SOLUTIONS

## KE3 (B) – Fundamentals of Law

මාර්තු 2019

NOT FOR SALE

All Rights Reserved

## **1** වන කොටස

**පිළිතුරු අංක 01**

1.1

| | |
|---|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 1.2.1<br>ශ්‍රී ලංකාවට අදාළ වන ප්‍රධාන නීති පද්ධති හඳුනා ගැනීම. | |
| පිටු අංක: 7 | |
| **නිවැරදි පිළිතුර: D** | |

1.2

| | |
|---|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 2.6.1<br>විවිධ ආකාරයේ ගිවිසුම් සඳහා වූ කාලාවරෝධ කාලසීමාව හඳුනා ගැනීම. | |
| පිටු අංක: 71 | |
| **නිවැරදි පිළිතුර: C** | |

1.3

| | |
|---|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 2.3.1<br>අරමුණු අනීතිකවීමේ බලපෑම සහ එහි ප්‍රතිවිපාක පැහැදිලි කිරීම. | |
| පිටු අංක: 63 සහ 64 | |
| **නිවැරදි පිළිතුර: D** | |

1.4

| | |
|---|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 3.2.1 සහ 3.3.1<br>භාණ්ඩ විකිණීමේ ගිවිසුමකට අදාළ ව්‍යංග කොන්දේසි සහ ප්‍රතිඥාභාර පැහැදිලි කරන්න.<br>අවදානම මාරුවෙන අවස්ථාවේ දී හිමිකම පැවරෙන ආකාරය සාකච්ඡා කරන්න.<br>(නිශ්චය නොකල භාණ්ඩ හිමිකම් වෙන්කර තබා ගැනීම, කොටස් වශයෙන් බෙදාහැරීම වෙන්දේසියේ විකිණීම අයිතිකරු නොවන වෙනත් පුද්ගලයකුට විකිණීම.) | |
| පිටු අංක: 90 - 92/85 | |
| **නිවැරදි පිළිතුර: C** | |

1.5

| | |
|---|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 4.3.1<br>විනිමය බිල්පතක් සම්බන්ධයෙන් "යථාකාල ධාරකයා" සහ "ඉදිරිපත් කිරීම" යන කරුණු වල අර්ථ නිරූපනය සහ වාණිජ වැදගත්කම නිර්වචනය කරන්න. | |
| පිටු අංක: 108 | |
| **නිවැරදි පිළිතුර: A** | |

NOT FOR SALE

1.6

| |
|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 5.4.1<br>පාර්ශ්වයන් අතර, ක්‍රියාවන් මගින් සහ නීතිය ක්‍රියාත්මක වීමෙන් නියෝජ්‍යාත්ව ගිවිසුමක් අවිනිශ්චිත අවස්ථා සඳහන් කිරීම. |
| පිටු අංක: 134-135 |
| **නිවැරදි පිළිතුර: B** |

1.7

| |
|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 5.7.6<br>හවුල්කරුවන් සහ තෙවන පාර්ශ්වයන් අතර ඇති සම්බන්ධතාවය සඳහන් කිරීම. |
| පිටු අංක: 147, 148, 149,150 |
| **නිවැරදි පිළිතුර: B** |

1.8

| |
|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 7.1.1<br>අදාළ ව්‍යාතිරේඛ සහිතව අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදලට කවුරුන් දායක මුදල් ගෙවිය යුතුද යන්න සඳහන් කරීම. |
| පිටු අංක: 211 |
| **නිවැරදි පිළිතුර: A** |

1.9

| |
|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 7.1.1<br>අදාළ ව්‍යාතිරේඛ සහිතව අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදලට දායක මුදල් ගෙවිය යුතුද යන්න සඳහන් කිරීම. |
| පිටු අංක: 214-215 |
| **නිවැරදි පිළිතුර: D** |

1.10

| |
|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 8.2.1<br>2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත පිළිබඳව කෙටියෙන් සඳහන් කිරීම. |
| පිටු අංක: 228/229 |
| **නිවැරදි පිළිතුර: D** |

**(2 x 10 = මුළු ලකුණු 20)**

**පිළිතුර 02**

2.1

| ඉගෙනුම් ප්‍රතිඵල: 1.1.1 |
|---|
| පිටු අංක: 5 |

ව්‍යවස්ථා:

- පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලැබූ (පනවනු ලැබූ නීති) පනත් සහ ආඥා පනත් මින් අදහස් කරයි.
- ඒවා පනවනු ලැබූ නීති හෝ ව්‍යවස්ථාපිත නීති යයිද කියනු ලැබේ.
- ව්‍යවස්ථා යන්නට පවරාදෙනු ලැබූ බලය පිට ඇති කල අනුනීති, පළාත් පාලන ආයතන අධිකාරිය විසින් සාදන අනු නීති, නියෝග, රෙගුලාසි ආදියද ඇතුළත් වේ.

2.2

| ඉගෙනුම් ප්‍රතිඵල: 2.5.1 |
|---|
| පිටු අංක: 69 |

ගිවිසුමක් කඩ කිරීමේ දී අහිංසක පාර්ශ්වයට ලබා ගත හැකි පිළියම් පහත පරිදි වේ.

1. තවදුරටත්, ගිවිසුම ඉටුකිරීම ප්‍රතික්ෂේප කිරීම.
2. හානි සඳහා වන්දි හිමිකම් පෑම.
3. "කොන්ටම් මෙරුට් " ප්‍රමාණික ගෙවීම් මත නඩු පැවරීම.
4. නිරූපිත ලෙස ඉටුකිරීම සඳහා නඩු පැවරීම.
5. වාරණ (ඉන්ජන්ෂන්) නියෝගයක් සඳහා නඩු පැවරීම.
6. අසාධාරණ ලෙස පොහොසත්වීමේ සිද්ධාන්තය යටතේ සහනයක් පැතීම.

2.3

| ඉගෙනුම් ප්‍රතිඵල: 3.4.1 |
|---|
| පිටු අංක: 84-85 |

1896 අංක 11 දරන භාණ්ඩ විකිණීමේ ආඥා පනත යටතේ පහත සඳහන් නියමයන්, තේ විකිණීමේ ගිවිසුමක ව්‍යංගයන් සම්බන්ධයෙන් වේ.

1. විකුණුම්කරුට භාණ්ඩ විකිණීම සඳහා අයිතියක් ඇති බවට ව්‍යංග කොන්දේසියක් ඇත.
2. භාණ්ඩවල නිරවුල් භුක්තිය ලැබීමටත්, භුක්ති විඳීමටත්, ව්‍යංග ප්‍රතිඥාභාරයක් ඇත.
3. ගිවිසුමට එළඹීමට පෙර, ගැණුම්කරු නොදැන සිටි බැඳීම් හෝ වෙනත් අවහිරයන්ගෙන් භාණ්ඩ නිදහස් විය යුතු බවට ව්‍යංග ප්‍රතිඥාභාරයක් ඇත.

NOT FOR SALE

2.4

ඉගෙනුම් ප්‍රතිඵල: 4.2.1

පිටු අංක: 109

1927 අංක 25 දරන විනිමය බිල්පත් ආඥා පනත යටතේ, පිටසන් කිරීමක් වලංගුවීම සඳහා පහත සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කළ යුතු වේ.

- එය බිල්පතෙහිම ලියා පිටසන් කරන්නා විසින් අත්සන් කළ යුතුය.
- එය සම්පූර්ණ බිල්පතට පිටසන් කිරීමක් විය යුතුය. (එනම් එය බිල්පතෙහි සම්පූර්ණ වටිනාකම පිටසන් කිරීමක්).
- හවුල්කරුවන් නොවන, දෙදෙනෙකුට හෝ ඊට වැඩි ආදායකයන් හෝ පිටසන් ලබන්නන් සංඛ්‍යාවකට ගෙවිය යුතු විට, අනෙක් අය වෙනුවෙන් ඉන් එක් අයෙකුට, පිටසන් කිරීමේ බලය පැවරී නැති අවස්ථාවක සියලු පාර්ශ්වයන් පිටසන් කළ යුතුයි.

2.5

ඉගෙනුම් ප්‍රතිඵල: 8.2.1

පිටු අංක: 232

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රෝනික ගනුදෙනු පනත යටතේ, ඉලෙක්ට්‍රෝනික ලේඛනයක පහත ලක්ෂණ පවතී නම්, නෛතිකව පිළිගනු ලබන ලේඛනයක් ලෙස සැලකේ.

1. එය පසු අවස්ථා වල දී යොමුවීම සඳහා ප්‍රවේශවිය හැකි විය යුතුය.
2. ලේඛණ වල අඩංගු කරුණු පිළිබඳව සාධාරණ සහතිකයක් තිබිය යුතුය.
3. දත්ත ජනනය සහ ගමනාන්තය හඳුනා ගත හැකි විය යුතුය.
4. ලේඛනය එය ජනනය වූ ආකාරයෙන්ම හෝ ජනනය වූ තොරතුරු නිවැරදිව ඉදිරිපත්වන පරිදි දැක්වීමට හැකි ආකෘතියක හෝ සුරක්ෂිතව රඳවා තැබිය යුතුය.
5. ලේඛනයේ ඉලෙක්ට්‍රෝනික අත්සනක් තිබිය යුතුය.

**(2 x 5 - මුළු ලකුණු 10)**

NOT FOR SALE

## 2 වන කොටස

**පිළිතුර 03**

(a)

| |
|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 2.1.1 |
| පිටු අංක: 40 – 41 |

මෙම දෙන ලද සංසිද්ධියේ දී, යමූ (Y) විසින් වලංගු යෝජනාවක් කර ඇත. Y සහ (K) අතර වලංගු ගිවිසුමක් ඇති කර ගැනීම සඳහා K විසින් වලංගු ප්‍රතිග්‍රහණයක් මෙම යෝජනාවට කල යුතුය. නමුත් K විසින් කරන ලද මෙම ප්‍රතිග්‍රහණය, Y විසින් යෝජනාව ඉල්ලා අස්කර ගැනීමට පෙර කළ යුතුයි.

යෝජනාව ඉල්ලා අස්කර කර ගන්නා ලද බැව්, පුවත්පත් දැන්වීමක් මගින් සෙනසුරාදා K ට දැනගැනීමට ලැබුනි. එය විශ්වාසනීය මාර්ගයකි.

Y විසින් ඇයගේ යෝජනාව, තවදුරටත් ඉරිදා දින පෙ.ව. 10.00 තෙක් විවෘතව තබන බව පවසන ලද නමුත් ඇයට, එකී යෝජනාව ඕනෑම විටක අස්කර ගැනීමට අයිතියක් ඇත.

එම නිසා, K විසින් ඉරිදා දින කරන ලද ප්‍රතිග්‍රහණය, එම අවස්ථාව වන විටත් යෝජනාව ඉල්ලා අස්කර ගෙන ඇති බැවින් වලංගු එකක් නොවේ.

එහි ප්‍රතිඵලයක් ලෙස Y සහ K අතර වලංගු ගිවිසුමක් ඇති නොවේ.

සමාන කරුණු ඩිකින්සන් එදිරිව ඩොඩ්ස් (Dickinson v Dodds) (1876) 2 Ch.D 463) නඩුවේ ද සාකච්ඡා කරන ලද. එහි දී තරණය වූයේ අර්පන ලාභීට විශ්වාසදායක මාර්ගයකින් යෝජනාව අවසන් කර ඇති බව, දැන ගැනීමට ලැබුන විටක දී පිළිගැනීම වලංගු නොවන බවයි.

(b)

| |
|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 2.2.1 |
| පිටු අංක: 48-50 |

(i)
කොන්දේසියක් යනු ගිවිසුමක නියමයක් වන අතර, එය ගිවිසුමේ "මූලය" දක්වා දිව යයි.
එනමුත් ප්‍රතිඥාහාරයක් එසේ නොවන නියමයක් වන අතර, එය ගිවිසුමක හරයට බලපෑමක් ඇති නොකරයි.

මෙම ගිවිසුමේ "නියත අවශ්‍යතාව" (of absolute essence) යන වචන යෙදීම තුලින් පාර්ශ්වයන් මෙම ජේදය/නියමය කොන්දේසියක් ලෙස අදහස් කර ඇත.

එම නිසා 5 වන වාරිකය ප්‍රමාද කර ගෙවීම කොන්දේසියක් කඩ කිරීමකි.

සමාන කරුණු ලොම්බාඩ් නොර්ත් සෙන්ට්‍රල් පී.එල්සී එදිරිව බටර්ස්වර්ත් (Lombard North Cental PLC v Buttersworth(1987) Q.B.527) නඩුවේ දී සාකච්ඡා කරන ලදී. එහි දී තීරණය වූයේ, ගිවිසුමේ වාරික මුදල් නියමිත ආකාරයෙන් ගෙවීම යන්න, අවශ්‍යතාවයක් වන අතර එමගින් පාර්ශ්වකරුවන් මෙම නියමය "ගිවිසුමේ කොන්දේසියක්" යන්න අදහස් කරයි. එසේ හෙයින් වාරිකයක් ප්‍රමාද කිරීම කොන්දේසියක් කඩ කිරීමක් වේ.

(ii)
වගකීමෙන් නිදහස් කිරීමේ වගන්තියක මූලික රීතිය වන්නේ, වගකීමෙන් නිදහස් කිරීමේ වගන්තියක් මගින්, ගිවිසුමක් යටතේ පාර්ශ්වයකට, මූලික බැඳීම් හෝ මූලික වගකීම් හෝ ඉවත් කළ නොහැකි බවයි.

දෙන ලද සිද්ධියේ දී වාරික ගෙවීම නියමිත කාලය තුල දී කල යුතු බව කොන්දෙසියක් වන අතර, එය ගිවිසුම යටතේ "සහේර්ගේ "(Z) මූලික වගකීමක් බවට පත්ව ඇත.

එම නිසා Z ට, වගකීමෙන් නිදහස් කිරීමේ වගන්තියක් හඳුන්වා දීමෙන් මෙම වගකීම ඉවත් කල නොහැක.

**(මුළු ලකුණු 10)**



NOT FOR SALE

**පිළිතුර 04**

(a)

| |
|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 3.3.1 |
| පිටු අංක: 87 - 88 |

මෙම සිද්ධියට සමාන සිදු වීමක්, පහත සඳහන් නඩුවේ දී සාකච්ඡා කරන ලදී.

නඩුවේ නම:

## (Kirham v Attenborough (1897) 1Q.B. 201

කර්හැම් එදිරිව ඇටන්බොරෝ

නඩුවේ කරුණු:

K විසින් "විකිණීමේ හෝ ආපසු එවීමේ" පදනම මත, W ට ස්වර්ණාභරණ යවයි. ඉන්පසු W විසින් එය A හට උකස් කරයි.

තීන්දුව:

W විසින් උකස් කිරීම ගණුදෙනුව අනුමත කිරීමකි. ඒ නිසා ස්වර්ණාභාරණ වල අයිතිය W ට පැවරේ. එහි ප්‍රතිඵලයක් ලෙස K ට A ගෙන් භාණ්ඩ ආපසු ලබා ගත නොහැක.

දින 30 ක් ඇතුලත විකිණීම හෝ ආපසු එවීම සඳහා ගැණුම්කරු වෙත භාණ්ඩ යවන ලද අවස්ථාවේ දී ගැණුම්කරුට හිමිකම පහත සඳහන් පරිදි මාරුවේ.

- ගැණුම්කරු භාණ්ඩ දින 30 අවසන් වන තෙක් රඳවා තබාගෙන සිටි විටක දී හෝ
- ගැණුම්කරු ඔහුගේ භාණ්ඩ භාර ගැනීම, අඟවන ලද අවස්ථාවක දී

මෙම දෙන ලද සිදු වීමේ දී, ඔහු පිළිගැනීම සෘජුවම "V" ට දැනුම් දෙනු නොලැබුවද, B විසින් XYZ බැංකුවට උකස් කරන ලද රන් මාල ඔහුගේ බව පිළිගෙන ඇත.

එම නිසා එම රන් මාල බැංකුවට උකස් තබන ලද අවස්ථාවේ දී රන් මාල වල හිමිකම B වෙත මාරු වී ඇත.

NOT FOR SALE

(b)

| |
|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 5.3.1/ 5.3.2 |
| පිටු අංක: 131-133 |

(i)

ප්‍රධානියා වශයෙන් "R" ගේ නියෝජිතයා වන P වෙත ඇති ප්‍රධාන වගකීම් (යුතුකම්) පහත පරිදි වේ.

- නියෝජිතයා වෙත ඔහුගේ කොමිස් හෝ වේතනය ගෙවීම.
- නියෝජිතයා විසින් කර ඇති, නීත්‍යානුකූල ක්‍රියාවන් සහ අධිකාරය බලය ඉටු කිරීමේ දී ඔහු විසින් දරන ලද බැඳීම් වලට ඔහුට වන්දි පූර්ණය කිරීම.

(ii)

නියෝජිතයා වශයෙන් "P" ගේ ප්‍රධානියා වන "R" වෙත ඇති ප්‍රධාන වගකීම් (යුතුකම්) පහත දැක්වේ.

- තම රාජකාරි ඉටු කිරීමේ දී නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීම සහ තමා සතු විශේෂ කුසලතාවන් යොදාගැනීම.
- අවශ්‍ය වූ විට ගිණුම් ඉදිරිපත් කිරීම.
- ඔහුගේ සේවා යෝජකට එරෙහිව ප්‍රධානියකු නොවීම.
- ප්‍රධානියාගේ උපදෙස් පිළිපැදීම.
- ඔහුගේ අධිකාර බලය වෙනත් අයකු වෙත නොපැවරීම.
- ප්‍රධානියාගේ රහස්‍ය තොරතුරු හෙළි නොකිරීම.
- ප්‍රධානියාගේ උපරිම යහපත සහ ප්‍රතිලාභය සඳහා ක්‍රියා කිරීම.
- රහසින් ලාභ ලබා නොගැනීම.

**(මුළු ලකුණු 10)**

NOT FOR SALE

THE INSTITUTE OF CHARTERED ACCOUNTANTS OF SRI LANKA

# නිවේදනය

මෙහි ලබාදුන් පිළිතුරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් (ශ්‍රී ලංකා ව.ග.) පමණක් ලබාදෙන ලද අතර, එම පිළිතුරු ඔබ විසින් එය "එසේම~" යන පදනම මත පිළිගත යුතු වේ.

එම පිළිතුරු "ආදර්ශ පිළිතුරු~" ලෙස අදහස් නොකරන නමුත් ඒවා බොහෝදුරට suggested solution ලෙස දක්වේ.

පිළිතුරු වලින් ප්‍රධාන අරමුණු දෙකක් ඉටුකෙරේ. ඒවා නම්,

01. විභාග ප්‍රශ්නයකට යෝජිත විසඳුමක් සඳහා සවිස්තරාත්මක නිදසුනක් (උදාහරණයක්) සැපයීම සහ,

02. ශිෂ්‍යයන්ට විෂය පිළිබඳව තොරතුරු පර්යේෂණය කිරීම සඳහා අත්වැලක් සැපයීම සහ විෂය පිළිබඳව ඔවුන්ගේ අවබෝධය සහ අගය වර්ධනය කිරීම.

    මෙම යෝජිත විසඳුම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) කිසිඳු ප්‍රතිඥාභාරයක් ලබා නොදෙන නිසා ඒ සම්බන්ධව කිසිඳු අගතියකට පත්වීමක් පිළිබඳව මැසිවිල්ලක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ඉදිරිපත් කිරීමට ඔබ හට හේතුවක් නොමැත. ඒ කෙසේ වෙතත් ඔබ විසින් යම් නඩුකරයක්, වන්දි ඉල්ලීමක්, පෙත්සමක්, තර්ජනය කිරීමක් හෝ බලවත් ඉල්ලීමක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ගොනුකරනු ලැබ එයින් සැලකියයුතු අන්දමේ ජයග්‍රහණයක් ලබා නොගතහොත් ඔබ විසින් එම නඩුකරයට අදාළ සම්පූර්ණ නෛතික ගාස්තු සහ වියදම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතු වේ. එනයින්ම මෙම අයිතිවාසිකම හෝ මෙහි විස්තර කෙරෙන හෝ ශ්‍රී ලංකාවේ නීතීන් යටතේ හිමි වෙනත් අයිතිවාසිකම් බලාත්මක කරවා ගැනීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) නෛතික ක්‍රියාමාර්ගයකට යොමුවීමට සිදුවුවහොත්, ඊට අදාළ නෛතික ගාස්තු සහ වියදම්ද ඔබ විසින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතුවේ.

---

2 2013 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) මගිනි.
සියළුම හිමිකම් ඇවිරිණි.

**මෙම ලේඛණයේ කිසිම සටහනක් ප්‍රතිඋත්පාදනය කිරීම, කුමන හෝ ආකාරයකින් හෝ ක්‍රමයකින් එනම්, ඉලෙක්ට්‍රොනික, යාන්ත්‍රික, ඡායා පිටපත් කිරීම, වාර්තාගත කිරීම හෝ වෙනත් ක්‍රමයකින් සම්ප්‍රේෂණය කිරීම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ශ්‍රී ලංකා ව.ග.) පූර්ව ලිඛිත අවසරයකින් තොරව සිදු නොකළ යුතුය.**

NOT FOR SALE